**ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය - 2023**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ (“සම්මේලනය”) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය සහ විස්තිරණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සහ 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධන) පනතේ 9 වන වගන්තියෙන් සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 21.අ වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ, කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිතිවයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට (SLFRS for SMEs) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං. වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය දරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සම්මේලනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සම්මේලනයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සම්මේලනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සම්මේලනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සම්මේලනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සම්මේලනය කටයුතු කර ඇති බව,

- සම්මේලනයේ සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 ලැබියයුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබියයුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. 62,576,299 ක් හා රු. 11,973,738 ක් වූ ලැබියයුතු ශේෂයන් පිළිවෙලින් වසර 2 සිට 5 දක්වා සහ වසර 5කට වැඩි කාලයක් අයකරගෙන නොමැත. තව ද, මූල්‍ය ප්‍රකාශනවල හානිකරණය සඳහා ප්‍රතිපාදන සලසා නොමැත. | 2025 සිට ලැබිය යුතු ගිණුම්වල අයකරගත නොහැකි ශේෂයන් හඳුනාගෙන ඒවා හානිකරණය කිරිමට එකඟවෙමි. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව හිඟමුදල් අයකරගැනීමට කඩිනම් පියවරගත යුතුය. |

### 1.5.2 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අත්තිකාරම් රු.591,484 ක් සහ රු.3,717,115 ක් පිළිවෙලින් වසර නවයකට වැඩි කාලයක් සහ වසර 2 සිට 4 දක්වා කාලයක් පැවත එන අතර මෙම වාර්තාවේ දින දක්වාම පියවා නොතිබුණි. | මෙයින් රු.591,484 ක මුදල පියවිය නොහැකි බවත් විධායක කමිටුවේ අනුමැතියට යටත්ව එය ගිණුම් වලින් ඉවත් කිරිමට පියවර ගන්නා බවත් දන්වා සිටිමි. | අත්තිකාරම් පියවීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හා එම පනත සඳහා වන සංශෝධන | ආදායම් බදු ගෙවීම සඳහා සම්මේලනය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොතිබුණි. | ජාතික ක්‍රීඩා සම්මේලනයක් ලෙස, අපගේ සම්මේලනය ලාභ නොලබන ආයතනයක් ලෙස ලියාපදිංචි කර තිබේ. | සම්මේලනය පනතේ විධිවිධාන පිළිපැදිය යුතුය. |
| (ආ) | 2016 ඔක්තෝබර් 27 දිනැති අංක 1990/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් පළ කරන ලද, ක්‍රීඩා රෙගුලාසි වල III කොටසේ xii වගන්තිය | සම්මේලනය විසින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2022 හා 2023 වර්ෂවලදී තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය හා ජාත්‍යන්තර පාපන්දු සම්මේලනය විසින් දේශපාලන මැදිහත්වීම නිසා ජාත්‍යන්තර තහනමක් පනවා තිබුණි. එමනිසා කිසිදු ක්‍රියාකාරකමක් සිදු කිරීමට හැකියාවක් නොතිබුණි. | ක්‍රීඩා රෙගුලාසි අනුගමනය කළ යුතුය. |
| (ඇ) | 2021 දෙසැම්බර් 15 දිනැති ජාතික ක්‍රීඩා සංගම් / සම්මේලනවල සංගම්වල කටයුතු සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| | (i) 3 (iii) වගන්තිය | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමකින් තොරව සම්මේලනය විසින් බැංකු ගිණුම් නවයක් (09) පවත්වාගෙන ගොස් තිබුණි. | මෙම කරුණ සම්බන්ධයෙන් මීට පෙර වර්ෂවලදී ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කර ඇත. | මාර්ගෝපදේශවල විධිවිධාන අනුගමනය කළ යුතුය. |
| | (ii) 3(iv) වගන්තිය | 2023 දෙසැම්බර් 31 දිනට රු.373,142,353 ක් වටිනා ස්ථාවර වත්කම් සඳහා භෞතික සත්‍යාපනයක් සිදු කර නොතිබුණි. | 2022 හා 2023 වර්ෂවලදී තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය හා ජාත්‍යන්තර පාපන්දු සම්මේලනය විසින් දේශපාලන මැදිහත්වීම නිසා ජාත්‍යන්තර තහනමක් පනවා තිබුණි. එමනිසා කිසිදු ක්‍රියාකාරකමක් සිදු කිරීමට හැකියාවක් නොතිබුණි. | මාර්ගෝපදේශවල විධිවිධාන අනුගමනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.180,920,700 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.51,309,070 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.232,229,770 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධානතම හේතුව වූයේ, 2023 ජනවාරි 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාත්‍යන්තර පාපන්දු සම්මේලනය විසින් ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය අත්හිටුවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ආදායමක් නොලැබීමයි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම්වල ප්‍රතිශතයන් සමඟ පහත දැක්වේ.

| විස්තරය | 2023 දෙසැම්බර් 31 දිනට වටිනාකම | 2022 දෙසැම්බර් 31 දිනට වටිනාකම | විචලනය | |
|---|---|---|---|---|
| | | | වාසිදායක/ (අවාසිදායක) | ප්‍රතිශතය |
| | රු. | රු. | රු. | % |
| **ආදායම්** | | | | |
| FIFA දායකත්වය | - | 375,931,250 | (375,931,250) | 100 |
| මූල්‍ය සහ වෙනත් ආදායම් | 10,956,120 | 37,982,765 | (27,026,645) | 71 |
| විදේශ විනිමය හුවමාරු ලාභය | - | 134,271,225 | (134,271,225) | 100 |
| **වියදම්** | | | | |
| පාපන්දු ආශ්‍රිත ඉසව් සහ තරඟාවලි වියදම් | 64,774,167 | 330,322,584 | 265,548,417 | 80 |
| මෙහෙයුම් වියදම් | 95,286,425 | 122,614,638 | 27,328,213 | 22 |
| ලීග් සහ පාපන්දු සංවර්ධන වියදම් | 7,969,058 | 30,978,087 | 23,009,029 | 74 |
| සුපර් ලීග් ආශ්‍රිත වියදම් | - | 12,960,861 | 12,960,861 | 100 |
| විදේශ විනිමය හුවමාරු අලාභය | 23,847,169 | - | (23,847,169) | 100 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුළ ජාත්‍යන්තර පාපන්දු සම්මේලනයෙන් ප්‍රදාන නොලැබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය සඳහා වන රු.191,876,820 ක්වූ මුළු වියදම රු.295,703,306 ක ආරම්භක බැංකු ශේෂය උපයෝගී කර ගනිමින් දරා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2013 ජනවාරි 01 සිට 2017 ජූලි 31 දක්වා කාලය තුළ සිදු කරන ලද මූල්‍ය වංචාව සම්බන්ධයෙන් හිටපු මූල්‍ය කළමනාකරුගෙන් රු. 48,388,399 ක මුදලක් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද, ඔහුට එරෙහිව ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ගවල වත්මන් තත්ත්වය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම මූල්‍ය වංචාව සම්බන්ධයෙන් නඩු අංක HC-CRM 4563/2023 යටතේ දැනටමත් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී. | සම්මේලනයට සිදු වූ පාඩුව අයකර ගැනීමට පියවර ගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 අප්‍රේල් 04 දින සිට ක්‍රියාත්මක වන පරිදි තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සම්මේලනයේ ලියාපදිංචිය අත්හිටුවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ සම්මේලනයට කිසිදු ආදායමක් හෝ ප්‍රදානයක් ලැබී නොතිබුණි. 2021 සහ 2022 වර්ෂ සඳහා මෙහෙයුම් ආදායම පිළිවෙලින් රු.315,215,325 සහ රු.375,931,250 ක් විය. තවද, පෙර වර්ෂයේ රු.51,309,071 ක අතිරික්තය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් ඌනතාවය රු.180,920,700 ක් විය. එමෙන්ම මෙම තත්ත්වය සම්මේලනයේ ක්‍රියාකාරීත්වයට සහ මෙරට පාපන්දු ක්‍රීඩාවේ දියුණුවට අහිතකර ලෙස බලපා තිබුණි. | 2023 ජනවාරි 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය අත්හිටුවීම හේතුවෙන්, FIFA හෝ AFC විසින් සම්මේලනයේ බැංකු ගිණුම්වලට කිසිදු අරමුදල් ප්‍රේෂණය නොකෙරේ. | අනාගතයේදී සම්මේලනය අත්හිටුවීම වැළැක්වීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතුය. |